2024-09

Learning Resource Centre
De Mazenod College
Kandana

# මීගමුව අධ්‍යාපන කලාපය

## 11 ශ්‍රේණිය

## දෙවන වාර පරීක්ෂණය - 2024

**කතෝලික ධර්මය I, II** | **පැය තුනයි**

## කතෝලික ධර්මය I

උපදෙස්:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති අංක (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරා ගන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංක සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

1. "දේව වේදිය කතා" ලෙස හඳුන්වන, පුරාණ ගිවිසුමට අයත් පොත් කාණ්ඩය වන්නේ,

(1) ප්‍රඥා පොත් (2) ඉතිහාස පොත්
(3) දිවැසි පොත් (4) එළිදරව් සාහිත්‍යය

2. ලූක් ශුභාරංචියේ දෙවන කාණ්ඩය ලෙස සලකනු ලබන නව ගිවිසුමට අයත් ග්‍රන්ථය වන්නේ,

(1) කොලොස්සි ලිපිය (2) එළිදරව්ව
(3) ක්‍රියා පොත (4) නික්මයාම

3. පාවුලු තුමා විසින් ම රචනා කරන ලද ග්‍රන්ථයක් වන්නේ,

(1) රෝම (2) එපීස (3) ජාකොබ් (4) 1 තිමති

4. ඉශ්‍රායෙල් දිවැසිවරුන් ක්‍රමයෙන් අතුරුදහන් වන යුගයක බිහි වූ, එළිදරව් සාහිත්‍යට අයත් ග්‍රන්ථය වන්නේ,

(1) දානියෙල් ග්‍රන්ථය (2) එළිදරව්ව ග්‍රන්ථය (3) යෙසායාගේ ග්‍රන්ථය (4) නික්මයාම ග්‍රන්ථය

5. ජීවිත හරය, එහි ගැටලු, විනිශ්චය පිළිබඳ සංකල්පනා ආශ්‍රිත ව කෙරෙන විග්‍රහයක් ඇතුළත් වන හෙබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රභේදය වන්නේ,

(1) පවුල හා ගෝත්‍රික ප්‍රඥාව.

(2) රාජ්‍ය සභා ප්‍රඥාව.

(3) අභිධාර්මික ප්‍රඥාව.

(4) එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥාව.

6. "මෙතැන් පටන් මනුෂ්‍ය පුත්‍රයාණන් දෙවියන් වහන්සේගේ බලපරාක්‍රමයේ දකුණු පස වැඩහිඳිනු ඇත" මෙම පිළිතුරෙන් කුපිත වූ "ඔව්හු" ජේසුස් වහන්සේ ව ආණ්ඩුකාර පිලාත් වෙත ගෙන ගියහ." මෙහි "ඔවුහු" යන්නෙන් අර්ථවත් වන්නේ,

(1) පරිසිවරු (2) ලේකම්වරු (3) යුදා සෙනෙට් සභාව (4) යුදෙව් ශ්‍රේෂ්ඨාධිකරණය

7. ශුද්ධාත්මයාණන් වහන්සේ පැමිණීමේ බලාපොරොත්තුවෙන්, මරිය තුමිය ඇතුළු ශ්‍රාවක පිරිස ජේසුස් වහන්සේගේ ස්වර්ගාරෝහණයේ සිට දින ...................... ක් යාච්ඤා කරමින් කල් ගත කළහ. ඉහත හිස්තැන සඳහා සුදුසු වරණය වන්නේ,

(1) 09 (2) 07 (3) 10 (4) 40

8. සාවුල් නායක පූජකයාගෙන් අවසර පතක් ලබාගෙන කිතුණුවන් අත්අඩංගුවට ගැනීමට ගියේ,

(1) එපීසයට (2) ජෙරුසලමට

(3) දමස්කයට (4) ගලීලයට

9. "ශුද්ධ වූ සභාව ශුද්ධවත් වන්නේ එය ශුද්ධ වූ ත්‍රිත්වයට ඇති සම්බන්ධතාව මත ය." ඉහත ප්‍රකාශය සනාථ **නොකරන** වරණය වන්නේ,

(1) ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කර ඇත.

(2) දෙවියන් වහන්සේ විසින් තෝරා ගත් ශුද්ධ වූ ජනතාවකි.

(3) ශුද්ධ වූ සභාව ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් මෙහෙයවන සේක.

(4) දෙවියන් වහන්සේ විසින් තෝරා ගත් ජනතාවකි.

10. 1948 දී ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසු කතෝලික සභාව මුහුණ දුන් ප්‍රධාන ම ගැටලුව වූයේ,

(1) ආගම ඉගැන්වීම සතියකට කාලච්ඡේද දෙකකට සීමා කිරීම ය.

(2) විදේශීය ධර්මදූතවරුන්ගේ වීසා අළුත් නොකළ නිසා ඔවුන්ට නැවත තම රටවලට යාමට සිදු වීම ය.

(3) 1961 දී පාසල් රජයට පවරා ගැනීමය.

(4) කිතුනුවන් කෙරෙහි නිර්දය විවේචනයන් එල්ල වීම ය.

11. පුරාණයේ යාග පූජා සඳහා ආහාර-පාන හා සතුන් යොදා ගන්න ද එයින් වඩාත් ම වැදගත් වූයේ, සත්ත්ව පූජා ය. එයට හේතුව වූයේ,

(1) සත්ත්වයාගේ රුධිරයෙන් ජේසුස් වහන්සේගේ පරිත්‍යාගිත්වය සංකේතවත් වූ බැවිනි.

(2) සත්ත්වයාගේ රුධිරය තුළ ජීවිතය අන්තර්ගත වූ බැවින් හා ජීවිතය දෙවියන් වහන්සේට අයිති වූ බැවිනි.

(3) මරණයේ සංකේතය රුධිරය වූ බැවිනි.

(4) විවිධ දේව රූප සත්ත්ව රූපවලින් සමන්විත වූ බැවිනි.

12. යුදා පාස්කු භෝජනයේ මූලිකාංගයක් වන්නේ,

(1) පාස්කු බැටලුවා (2) පලා වර්ග

(3) මුහුන් සහිත රොටි (4) කොබෙයියා

Learning Resource Center
De Mazenod College
Kandana

2024.09

13. පහත සඳහන් ප්‍රකාශ කෙරේ අවධානය යොමු කරන්න.

A නැගෙනහිර හා බටහිර ජර්මනිය වෙන් කළ බර්ලින් තාප්පය බිඳ දමා රට එක්සත් කිරීමට මූලික වීම.

B පාර දෙපස වීදි, මුඩුක්කු හා පැල්පත්වාසීන්ගේ ජීවිත පිළිබඳව ඇති වුණු අනුකම්පාවෙන් අසරණයන්ට පිහිට වීම.

C "මරිය තුමියගේ ශ්‍රී හෘදයේ හමුදාව" යන සංවිධානය ආරම්භ කිරීම.

D අයුක්තිය හා අසාධාරණයට විරුද්ධ දිළිඳු, ගොවි ජනතාව වෙනුවෙන් හඬ නැගීම.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් ගරු මයිකල් රොද්‍රිගු පියතුමා ට අදාළ වරණය වන්නේ,

(1) A (2) B (3) C (4) D

14. මුල් කිතුනු සභාව තුළ උපස්ථායකයින් ට පැවරූ ප්‍රධාන වගකීම වූයේ,

(1) සුබ අස්න දෙසීම. (2) රෝගීන් සුව කිරීම.

(3) සහනාධාර බෙදා දීම. (4) යක්ෂයින් දුරු කිරීම.

15. සෑතුගීසි සමය තුළ මෙරට සේවය සඳහා පැමිණි ධර්මදූත නිකායක් වන්නේ,

(1) සිල්වෙස්ත්‍රෝ බෙනදික්තාන නිකාය (2) නිර්මල මරිය නිකාය

(3) ජේසු නිකාය (4) ෆ්‍රැන්සිස්කාන නිකාය

16. දිව්‍ය පූජා යාගය සිදු කිරීමේ ප්‍රධාන අරමුණක් වන්නේ,

(1) දෙවියන් වහන්සේට නමස්කාර කිරීම. (2) දෙවියන් වහන්සේට ආදරය දැක්වීම.

(3) ජේසුස් වහන්සේගේ ඉල්ලීම ඉටු කිරීම. (4) දේව කැමැත්ත ඉටු කිරීම.

17. "විශ්වාසය, බලාපොරොත්තුව හා ………….. පළමු පනත හා අත්වැල් බැඳගෙන යාච්ඤාව තුළ සම්පූර්ණත්වයට පත් වන්නේ ය." මෙම හිස් තැනට සුදුසු පිළිතුර වන්නේ,

(1) ප්‍රේමය (2) කීකරුකම

(3) ඉවසීම (4) දයාව

18. "දරුවෙනි, සියලු කාරණාවල දී දෙමව්පියන්ට කීකරු වන්න. මන්ද ඔබ එසේ කිරීම සමිඳාණන් වහන්සේට ප්‍රීතියකි." මෙසේ සඳහන් වන්නේ පාවුලු සංදේශයන් හී කුමන ලිපියේ ද?

(1) රෝම (2) කොලොස්සි

(3) කොරින්ති (4) එපීස

19. මිනිසා තම ශරීරයට විරුද්ධව සිදු කරන බරපතල පාපය වන්නේ,

(1) සොරකම් කිරීම. (2) මිනී මැරීම.

(3) අනාචාරය. (4) අන් වස්තුවලට ආශා කිරීම.

20. සුබාරංචි කතුවරුන් හතර දෙනා ම වාර්තා කරන එක ම ප්‍රාතිහාර්යය වන්නේ,

(1) පූප වැඩිකිරීම.
(2) අංගභාග රෝගියා සුව කිරීම.
(3) කානා නුවර ජලය මිදි යුෂ බවට හැරවීම.
(4) ජාත්‍ය අන්ධයා සුව කිරීම.

21. නිල වශයෙන් ජනවන්දනා වර්ෂය (දේව වන්දනා වර්ෂය) ආරම්භ වන්නේ,

(1) සාමාන්‍ය සමයේ තුන්වන ඉරු දිනෙනි.
(2) ආගමන කාලයේ පළමුවන ඉරු දිනෙනි.
(3) චතාරික සමයේ අවසාන සතියෙනි.
(4) පාස්කු සමයේ දෙවන සතියෙනි.

22. සමදර්ශක සුබාරංචි කතුවරුන්, ජේසුස් වහන්සේ මහා බ්‍රහස්පතින්දා දින දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීම පිළිබඳ ව සඳහන් කළ ද, සුවිශේෂක ජොහන් තුමා ඒ සිදුවීම වාර්තා නොකරයි. ඒ වෙනුවට, එතුමා සඳහන් කරන සිදුවීම වන්නේ,

(1) ජේසුස් වහන්සේව මල් උයනේ දී අත්අඩංගුවට ගැනීමයි.
(2) ජේදුරුගේ පාවා දීමයි.
(3) උත්තම පූජක යාච්ඤාව යි.
(4) ජේසුස් වහන්සේ විසින් තම ශ්‍රාවකයන්ගේ පාද සේදීමේ සිද්ධිය යි.

23. පහත සඳහන් ප්‍රකාශ කෙරේ අවධානය යොමු කරන්න.

A සාහිත්‍යමය (භාෂා) ශෛලිය කතාන්දර ස්වරූපීයි. B කෙටිය ය; විස්තරාත්මක නොවේ.

C භාෂා ශෛලිය අනුශාසනාත්මක ය. D ජනවන්දනාව පිළිබඳ ව විශේෂ අවධානයක් දී ඇත.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් "යාවේ" සහ "පූජක" සම්ප්‍රදායන් ට අයත් අක්ෂර ඇතුළත් වන නිවැරදි වරණය වන්නේ,

(1) A සහ B
(2) B සහ D
(3) A සහ D
(4) A සහ C

24. පුරාණ ගිවිසුමට අයත් ද්විතීය සම්මත ග්‍රන්ථයක් වන්නේ,

(1) ජෝබ්
(2) උත්පත්ති
(3) ගීතාවලිය
(4) ජුදිත්

25. "**දේව කැමැත්ත නොහොත් පණිවුඩය අන් අයට ප්‍රකාශ කරන තැනැත්තා**" යන අර්ථය දැක්වෙන හෙබ්‍රෙව් පදය වන්නේ,

(1) නබි
(2) අපාර්
(3) ප්‍රොෆේටේස්
(4) අදමහ්

26. දිවැසිවරුන්, ප්‍රධාන හා සුළු ලෙස වර්ගීකරණයට පදනම වන්නේ,

(1) දිවැසිවරුන් ජීවත් වූ කාලය ය.
(2) එක් එක් දිවැසිවර ග්‍රන්ථයේ විශාලත්වය ය.
(3) එම ග්‍රන්ථවල දක්වා ඇති කරුණුවල වැදගත්කම ය.
(4) එම ග්‍රන්ථ රචනා වූ කාල වකවානුව ය.

27. මිනිසාගේ උතුම්කම විද්‍යාමාන **නොවන** වරණය වන්නේ,

(1) බුද්ධිය (2) නිදහස් කැමැත්ත

(3) චින්තන හැකියාව (4) අමරණීය ආත්මය

28. තම ගැලවීම හා පව් සමාව දෙවියන් වහන්සේගෙන් යැයි බලාපොරොත්තු නොවීම හඳුන්වන්නේ,

(1) ඉච්ඡාභංගත්වය (2) අනුමානය (3) මනස්ථාපනය (4) ඇදහිල්ල

29. උත්පත්ති පොතේ පළමුවන පරිච්ඡේදයේ සිට එකොළොස්වන පරිච්ඡේදය දක්වා වූ කොටස හඳුන්වන්නේ,

(1) ආදිපිතෘ යුගය. (2) ගැලවීමේ ඉතිහාසය.

(3) මැවීමේ ඉතිහාසය. (4) ප්‍රාග් ඉතිහාසය

30. "එකල ජෝසෙප් ගැන කිසිවක් නොදත් අලුත් රජෙක් සිංහාසනාරූඪ විය **"ජෝසෙප් ගැන කිසිවක් නොදත් රජතුමා"** යන්නෙහි අර්ථය වන්නේ,

(1) ජෝසෙප් මිසරයට කළ මහඟු සේවාව පිළිබඳව නව රජතුමා කිසිත් නොදන්න බවය.

(2) මිසරයේ සෑම රජකෙනෙක් ම ජෝශප් ගැන දැනගත යුතු බවය.

(3) ජෝසප් ට සෑම රජෙක්ම ගරු කළ යුතු බව ය.

(4) ජෝසෙප් මිසරයට අමරණීය පුද්ගලයෙකු වන බවය.

31. සාමාන්‍ය එඬේරික ජීවිතයක් ගත කළ ඉශ්‍රායෙල් ජනතාව, සුවිශේෂී දේව ජනතාවක් බවට පත්වූයේ,

(1) පොරොන්දු දේශයක් කරා රැගෙන යාම මඟිනි. (2) සීනායි ගිවිසුම මගිනි.

(3) පාස්කුව සැමරීම මඟිනි. (4) වසංගත 12 මගිනි.

32. "ඔහු ස්වාමීන් වහන්සේ අබිමුවෙහි ශ්‍රේෂ්ඨ වන්නේ ය. ඔහු මිදියුසවත්, මත්පැන්වත් නොබොන්නේ ය. මව්කුස සිට ම ඔහු ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වන්නේ ය." ඉහත බයිබල් පාඨය හා බැඳි පුද්ගල චරිතය වන්නේ,

(1) යෙසායා දිවැසිවරයා. (2) පාවුලු තුමා.

(3) ස්නාවක ජුවාම් තුමා. (4) පේදුරු තුමා.

33. ශුද්ධ වූ අම්බ්‍රෝස් තුමාට අනුව **"ජීවත් වීම"** යනු?

(1) ප්‍රශ්නවලට හොඳින් මුහුණ දීම ය. (2) දුක් වේදනා ඉවසීමෙන් දරා ගැනීම ය.

(3) ඉපදුණු නිසා ජීවත් වීම ය. (4) ක්‍රිස්තුන් වහන්සේ සමග විසීම ය.

34. **"යමෙක් වතුරෙන් ද ආත්මයාණන්ගෙන් ද නූපන්නොත් ඔහුට ස්වර්ග රාජ්‍යට පිවිසිය නොහැකි ය."** ජේසුස් වහන්සේ මෙසේ පැවසුවේ,

(1) නිකදේමුස් (2) අනනියස් ට (3) පේදුරු ට (4) ලාසරස් ට

35. ජේසුස් වහන්සේ සිදු කළ ප්‍රාතිහාර්ය තුළින් අපට හෙළිදරව් නොවන කාරණය වන්නේ,

(1) දෙවියන් වහන්සේ මිනිසාට දක්වන අසීමිත ප්‍රේමය.

(2) දෙවියන් වහන්සේව අනාවරණය වීම යි.

(3) මිනිස් දුබලතා ඉසමතු වීම යි.

(4) දේව මහිමය හා දේව බලය ප්‍රකාශ වීම යි.

36. පහත සඳහන් ප්‍රකාශ කෙරේ අවධානය යොමු කරන්න.

A සිතේ වැපුරූ දේ නපුරා අවුත් පැහැර ගනියි.

B පණිවුඩය අසා එය වටහා ගෙන සිය ගුණයක් ද හැට ගුණයක් ද ...බැගින් කෙනෙක් ඵල දරති.

C පණිවිඩය අසා මේ ජීවිතයේ කරදරවලින් ද වස්තු මායාවෙන් ද නිසා කෙනෙක් ඵල නොදරති.

D පණිවිඩය ඇසූ කෙනෙහි ම එය සතුටින් සිතෙහි තැන්පත් වී නැති බැවින්, මද කලක් පැවත හිංසාවක් හෝ පීඩාවක් පැමිණි වහා ම කෙනෙක් පැකිළී වැටෙති.

"මඟ දිගට වැටුණු බීජ" නියෝජනය කරන, අක්ෂර ඇතුළත් වන නිවැරදි වරණය වන්නේ,

(1) A (2) B (3) C (4) D

37. අභිවෘද්ධි ආලේපය දානය කරන ප්‍රථම නිල සේවකයා වන්නේ,

(1) රාජගුරුප්‍රසාදීන් වහන්සේ (2) පූජාප්‍රසාදීන් වහන්සේ

(3) තේවාචාර්ය තුමා (4) සහෝදර තුමා

38. කිතුනු විවාහයේ ප්‍රධාන ලක්ෂණ ද්විත්වය වන්නේ,

(1) අන්‍යෝන්‍ය ප්‍රේමය සහ තේරුම්ගැනීම (2) ඒකත්වය සහ අඛණ්ඩත්වය

(3) ඉවසීම සහ විශ්වාසය (4) ඒකත්වය සහ පරාර්ථකාමිත්වය

39. අත්තික්කා කොළ අතු ඇඳ සිටි ආදම් සහ ඒවට දෙවියන් වහන්සේ විසින් හම් වස්ත්‍ර සාද දීමෙන් පෙන්නුම් කරන්නේ,

(1) මිනිසා සංවර්ධනය විය යුතු බව ය.

(2) මිනිසා නවීන විලාසිතා අනුකරණය කළ යුතු බව ය.

(3) දෙවියන් වහන්සේගේ කරුණාව, ආදරය හා රැකවරණය ය.

(4) මිනිසා දිව්‍ය සංරක්ෂණය මත යැපිය යුතු බව ය.

40. දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමඟ කළ ගිවිසුමේ කැපී පෙනෙන ප්‍රධාන කරුණු දෙක වන්නේ,

(1) සදහට ම හිමිවන දේශයක් ලබා දීම සහ විශ්වාසය වැඩි කිරීම.

(2) කානාන් දේශය ට රැගෙන යෑම සහ ඊසාක් ලබා දීම.

(3) දසපනත ලබා දීම සහ සීනයි ගිවිසුමට එළඹීම.

(4) අසංඛ්‍ය වූ දරු පරපුරක් ලබා දීම සහ සදහට ම හිමිවන දේශයක් ලබා දීම. (ලකුණු 1×40=40)

***

REGISTRAR
De Mazenod College
Kandana.

මීගමුව අධ්‍යාපන කලාපය මීගමුව අධ්‍යාපන කලාපය මීගමුව අධ්‍යාපන කලාපය මීගමුව අධ්‍යාපන කලාපය මීගමුව අධ්‍යාපන කලාපය මීගමුව අධ්‍යාපන කලාපය

# මීගමුව අධ්‍යාපන කලාපය

## 11 ශ්‍රේණිය

## දෙවන වාර පරීක්ෂණය - 2024

මීගමුව අධ්‍යාපන කලාපය මීගමුව අධ්‍යාපන කලාපය මීගමුව අධ්‍යාපන කලාපය

## කතෝලික ධර්මය II

- ❖ පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුලුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- ❖ පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

1. (i) එළදරව් සාහිත්‍යයේ එන සංඛ්‍යා සංකේත **දෙකක්** ක් ලියා, ඒවායේ අරුත් දක්වන්න.
   (ii) මුල් කිතුනු සභාවේ ලක්ෂණ **දෙකක්** ලියන්න.
   (iii) ශ්‍රී ලංකා ශුද්ධ වූ සභා ඉතිහාසයේ ප්‍රධාන යුග **දෙකක්** දක්වන්න.
   (iv) දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණ **දෙකක්** ලියන්න.
   (v) නෝවා තම කැඳවීම ලැබීමට හේතු වූ ප්‍රධාන කරුණු **දෙකක්** සඳහන් කරන්න.
   (vi) පංච පුස්තකය හඳුන්වන වෙනත් නම් **දෙකක්** දක්වන්න.
   (vii) ඉශ්‍රායෙල් ජනතාවගේ වර්ධනය මර්දනය කිරීමට මිසරයේ රජතුමා ගත් පියවර **දෙකක්** සඳහන් කරන්න.
   (viii) ජේසුස් වහන්සේ විසින් වදාළ, දේව රාජ්‍යය පිළිබඳව කියවෙන උපමා කතා **දෙකක** නම් ලියන්න.
   (ix) ආත්මික මව්පියකු වීමට තිබිය යුතු සුදුසුකම් **දෙකක්** දක්වන්න.
   (x) සතරාකාර ප්‍රාතිහාර්යය අතුරින් **දෙකක්** දක්වන්න. **(ලකුණු 2×10=20)**

2. (i) ශු. පාවුලු තුමා විසින් ලිපි (හසුන්) රචනා කරනු ලැබූ ප්‍රධාන පරමාර්ථ දෙක කුමක්ද?
   (ii) ශුද්ධ වූ පාවුලු තුමාගේ හසුන් වර්ගීකරණයේ ප්‍රභේද තුන කුමක්ද?
   (iii) පාවුලු තුමාගේ ජීවිතයෙන් ඔබගේ ජීවිතයට ගත හැකි ගුණාංග පහක් කෙටියෙන් විස්තර කරන්න.
   **(ලකුණු 2,3,5=10)**

3. (i) ප්‍රසාද ස්නාපන පොරොන්දු දෙක කුමක්ද?
   (ii) ස්නාවක ජොහන් තුමා දේශනා කළ ජන කොට්ඨාස තුන දක්වා එම ජනකොටස්වලට දුන් අවවාද එක බැගින් ලියන්න.
   (iii) ස්නාවක ජොහාන් තුමාගේ ආදර්ශය පෙරදැරිකරගෙන, කිතුනු දරුවෙකු ලෙස, සමාජය තුළ ඔබ යහපත්ව දිවිගෙවන ආකාරය කරුණු පහකින් කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 2,3,5=10)**

4. (i) ආදිපිතෘ ජෝශප් තුමා, පොතිපර්ගේ බිරිඳට එකඟ වූයේ නම් කඩවන පනත් දෙක කුමක්ද?
   (ii) ඉහත සඳහන් පනත්වලට විරුද්ධ පාප තුනක් නම් කරන්න.
   (iii) පිවිතුරු දිවියක් ගත කිරීම සඳහා ඔබ විසින් වර්ධනය කරගත යුතු යහපත් ගුණධර්ම පහක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2,3,5=10)

5. (i) මතෙව් 5, 6 සහ 7 පරිච්ඡේදවල සඳහන් කන්ද උඩ දේශනාවේ අන්තර්ගත ඉගැන්වීම් දෙකක් සඳහන් කරන්න.
   (ii) දේව රාජ්‍යයේ වටිනාකම් වැඩි දියුණු කරන ශ්‍රී ලාංකේය සාරධර්ම තුනක් දක්වන්න.
   (iii) පාසැල් සිසුන් අතර දේව රාජ්‍ය පතල කිරීමට ඔබට දායක විය හැකි ආකාරය කරුණු පහකින් විස්තර කරන්න. (ලකුණු 2,3,5=10)

6. (i) "ලිටුර්ජියා" (LEITOURGIA) යන ග්‍රීක වචනය "ලාඕස්" (LAOS) සහ "එර්ගොන්" (ERGON) යන වචනවලින් බිඳී එන්නකි. ඒවායේ අරුත් ලියන්න.
   (ii) ජනවන්දනාවේ ප්‍රධාන අංග තුන කුමක්ද?
   (iii) ඉරු දින දිව්‍ය පූජා යාගයට ඔබ සක්‍රීයව සහභාගී වන ආකාරය කරුණු 05 කින් පැහැදිලි කරන්න. (ලකුණු 2,3,5=10)

7. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
   (i) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත
   (ii) ශ්‍රී ලංකාවේ අපෝස්තුළුවරයා
   (iii) කතෝලික සභාවේ ලක්ෂණ
   (iv) නික්මයාම ගමන තුළ දිව්‍ය සංරක්ෂණය (ලකුණු 5×2=10)

***

REGISTRAR
De Mazenod College
Kandana.